**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2021 ජූලි

## (104) ව්‍යාපාරික පරිසරය

(Business Environment)

**හැඳින්වීම:**

මෙම ප්‍රශ්න පත්‍රය අදියර 1 - ව්‍යාපාරික පරිසරය විෂය නිර්දේශ**යෙහි** බොහෝ කොටස් ආවරණය වන පරිදි සකස් කරන ලද ප්‍රශ්න පත්‍රයකි. මූලික වශයෙන් මෙහිදී විභාග අයදුම්කරුවන්ගේ විෂයානුබද්ධ දැනුම හා අවබෝධය පරීක්ෂා කර ඇත. සමස්ථයක් ලෙස බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා සමත්ව තිබූ අතර අනිත් අය පිළිතුරු සැපයීම අතින් අසාර්ථක වී තිබුණි. අයදුම්කරුවන් සපයා තිබූ පිළිතුරු නිරීක්**ෂ**ණය කිරීමේදී දක්නට ලැබූ කාරණාව වන්නේ ප්‍රශ්න හරිහැටි තේරුම් නොගෙන පිළිතුරු සපයා තිබීම ලකුණු ලබාගැනීමට බාධාවක් වී තිබූ බවයි. නමුත් බහුතරයක් අයදුම්කරුවන් සියලු ප්‍රශ්න වලට සැලකියයුතු ලකුණු ලබා ගැනීමට සමත්ව තිබුණි.

පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද කරුණු පහත පරිදි වේ:

## <u>A - කොටස</u>

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ව්‍යාපාරික පරිසරය විෂය නිර්දේශයම ආවරණය වන පරිදි සකසා තිබූ අතර සියලුම අයදුම්කරුවන් පිළිතුරු සැපයිය යුතු විය. මුළු ලකුණු 100න් 40ක්ම මෙමගින් ආවරණය වූ අතර බහුතරයක් වූ අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු ඉදිරිපත්කර සතුටුදායක ලකුණු මට්ටමක් ලබාගෙන තිබුනි. සමහරක් අයදුම්කරුවන් ප්‍රශ්න 1.5, 1.8, 1.9, 1.14, 1.16 සහ 1.18 සඳහා සපයා තිබූ **බොහෝ** උත්තර වැරදි විය. ඒ සඳහා හදුනාගන්නා ලද පොදු වැරදි පහත දක්වා ඇත.

**1.5** බහුතරයක් අයදුම්කරුවන් "චෙක්පතක් අගරු වීම" යන්න **පිළිබඳ අව**බෝ**ධයක් නොතිබීම නිසා** උත්තරය ලෙස 1 සලකුණු කොට තිබුණි.

**1.8** බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නය හරිහැටි කියවීමකින් තොරව උත්තරය ලෙස " කල්බදු සමාගම්" තෝරාගෙන තිබු**ණි.**

**1.9** "ඉදිරි දාතම චෙක්පතක්" යනු කුමක්දැයි යන්න බොහොමයක් අයදුම්කරුවන් නොදැන සිටි බවක් නිරීක්ශනය විය. අයදුම්කරුවන් චෙක්පත් පිළිබඳව පැහැදිලි ලෙස දැන සිටිය යුතුය.

**1.14** බොහොමයක් අයදුම්කරුවන් **වැරදි උත්තරය** සපයමින් **දෙන ලද** ප්‍රකාශය අසත්‍ය ලෙස **ලකුණු කර** තිබු**ණි.**

**1.16** මෙම ප්‍රශ්නය සඳහාද බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුර **ලෙස** "තනි පුද්ගල ව්‍යාපාර සහ හවුල් ව්‍යාපාර" **යනුවෙන්** සඳහන් කර තිබූ **නමුත් එය නිවැරදි පිළිතුර නොවිය.**

**1.17** බොහොමයක් අයදුම්කරුවන් "විනිමය මාධ්‍යක්" යනු කුමක්දැයි අවබෝධයකින් තොරව "මුදල් හුවමාරුව" හා **බාටර් ක්‍රමය පිළිබඳව** සඳහන් කර තිබු**ණි.**

**1.18** "චෙක්පතක් පිටසන් කිරීම" (Endorsement) යනු කුමක්දැයි යන්න අවබෝධයකින් තොරව බොහොමයක් අයදුම්කරුවන් "චෙක්පතක් **රේඛණය** කිරීම" (Crossing) පිළිබඳව සඳහන් කර තිබු**ණි.**

## B - කොටස

මෙම කොටසෙහි අනිවාර්ය ප්‍රශ්න 04ක් විය. එක් ප්‍රශ්නයකට ලකුණු 10 බැගින් ලබාගත හැකිව තිබූ මුළු ලකුණු 40 කි.

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය සකසා තිබුනේ ව්‍යාපාර සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP) ස්ථාපිත කිරීම හා සම්බන්ධවය.

(a) සමස්ථයක් ලෙස ගත් කල බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට සාර්ථකව පිලිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි. අනිත් අය තනි පුද්ගල ව්‍යාපාර සහ හවුල් ව්‍යාපාරයන්හි ලක්ෂණ සඳහන් කර තිබුණි.

(b) සීමාසහිත පෞද්ගලික සමාගමක් ස්ථාපිත කිරීමේ වාසි සැලකියයුතු අයදුම්කරුවන් පිරිසක් නොදැන සිටිබව නිරීක්ෂණය විය. ඒ වෙනුවට හවුල් ව්‍යාපාරයක් ස්ථාපිත කිරීමේ වාසි දක්වා තිබුණි.

(c) තොරතුරු සන්නිවේදන තාක්ෂණය (ICT) සම්බන්ධ දැනුම පරික්ෂා කිරීම මෙම කොටසින් සිදුකෙරිණ. සැලකියයුතු පිරිසක් පිළිතුරු සපයා තිබුණේ ඔවුන්ගේ සාමාන්‍ය දැනීමෙනි.

### ප්‍රශ්න අංක 03

සන්නිවේදනය හා රක්ෂණය සම්බන්ධ දැනුම පරික්ෂාවට අදාල ප්‍රශ්නයක් විය.

(a) බහුතරයක් අයදුම්කරුවන් ඔවුන්ගේ සාමාන්‍ය දැනීමෙන් පිළිතුරු ලියා තිබුණි. කෙසේ නමුත් ඔවුන් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් විය.

(b) බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි. ඒ අතරින් සැලකියයුතු පිරිසක් සම්පූර්ණ ලකුණු ලබාගැනීමට සමත් විය.

(c) බොහෝ අයදුම්කරුවන් රක්ෂණයේ මූලධර්ම දෙකක් පැහැදිලි කිරීම වෙනුවට අර්ථ දක්වා තිබීම හේතුවෙන් මෙම කොටස සඳහා සම්පූර්ණ ලකුණු ලබාගැනීමට අසමත් වී තිබුනි.

කෙසේ නමුත් මෙම ප්‍රශ්නය සඳහා සමස්ථ කාර්යසාධන මට්ටම හා ලකුණු ලබාගැනීම හොඳ තත්වයක විය.

### ප්‍රශ්න අංක 04

(a) භාවිත කළහැකි ප්‍රවාහන ක්‍රම පිළිබඳව අවබෝධයකින් යුතුව බොහෝ අයදුම්කරුවන් මෙම කොටසට සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

(b) විද්‍යුත් වෙළදාමෙන් (E-Trade) ලැබෙන ප්‍රතිලාභ පිලිබඳව හොඳ අවබෝධයකින් යුතුව මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා තිබුණි.

(c) අපනයන වෙළඳාමේදී භාවිතාකරන මූලික ලියවිලි (Primary Documents) සම්බන්ධව බොහෝ අයදුම්කරුවන් හඳුනා ගත් බවක් නොපෙනුණි. සමහරක් ඔවුන්ගේ සාමාන්‍ය දැනීම උපයෝගී කරගෙන පිළිතුරු සපයා තිබුණි.

කෙසේ වෙතත් මෙම ප්‍රශ්නය සඳහා සමස්ථ කාර්යසාධනය මට්ටම හා ලකුණු ලබාගැනීම හොඳ තත්වයක විය.

## ප්‍රශ්න අංක 05

සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර (SME's) හා ව්‍යවසායකත්වය (Entrepreneurship) පිළිබඳ දැනුම පරික්ෂා කිරීම සඳහා මෙම ප්‍රශ්නය සකසා තිබුණි.

(a) බොහෝ අයදුම්කරුවන් ව්‍යවසායකයෙකු හා ව්‍යාපාරිකයෙකු අතර වෙනස හඳුනා ගැනීමට අසමත් වීම නිසා සම්පූර්ණ ලකුණු අහිමි කරගෙන තිබුණි.

(b) සැලකියයුතු අයදුම්කරුවන් පිරිසක් ප්‍රශ්නයට අදාල දර්ශනය හඳුනාගෙන පිළිතුරු සපයා නොතිබිණ. කෙසේ වෙතත්, ව්‍යාපාරයේ කාර්යසාධනය ඉහල නංවාගතහැකි ආකාරය සම්බන්ධයෙන් ඔවුන් සාමාන්‍ය දැනීම උපයෝගී කරගෙන පිළිතුරු සපයා ලකුණු ලබා තිබුණි.

(c) බොහෝමයක් අයදුම්කරුවන් ප්‍රාග්ධන වෙළඳපොල (Capital Market) වැදගත් වීමට හේතු දක්වා තිබුනේ ඔවුන්ගේ සාමාන්‍ය අවබෝධයෙනි. හරි ආකාරව ප්‍රශ්නය තේරුම් නොගැනීම සහ විෂය නිර්දේශයට අදාල පාඩම් මාලාව හරිහැටි අධ්‍යනය නොකිරීම මෙයට හේතු වන්නට ඇත.

## C - කොටස

## ප්‍රශ්න අංක 06

සිද්ධි අධ්‍යන ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය සකසා තිබුනේ හැපී සුපර් (Happy Super) නම් සුපිරි වෙළඳසැල් ජාලයේ ආයතනික සමාජ වගකීම් (CSR) සහ ප්‍රවාහනය (Transportation) සම්බන්ධ දැනුම ඉදිරිපත් කර ඇති සිද්ධියට අදාල කර ගන්නේ කෙසේද යන්න පරීක්ෂා කිරීම සඳහාය. සියලුම අයදුම්කරුවන් පිළිතුරු සපයා තිබූ අතර බොහෝමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු ඉදිරිපත්කර සතුටුදායක ලකුණු මට්ටමක් ලබාගෙන තිබුණි.

(a) ශ්‍රී ලංකා රජයේ ආර්ථික අරමුණු ඉටුකර ගැනීමෙහිලා හැපී සුපර් ආයතනයේ දායකත්වය පැහැදිලි කල යුතුව තිබුණි. බහුතරයක් සිසුන් මේ සඳහා සාර්ථකව පිළිතුරු ඉදිරිපත් කර තිබූ නමුත් පැහැදිලි කිරීම ප්‍රමාණවත් නොවිණි. ඒ නිසා ඔවුන්ට අදාල සම්පූර්ණ ලකුණු මගහැරී තිබුණි.

(b) PESTEL විශ්ලේෂණය භාවිතයෙන් හැපී සුපර් ආයතනයේ ව්‍යාපාරික පරිසරය තක්සේරු කරන ලෙස ප්‍රශ්නයෙන් ඉල්ලා තිබුණි. බහුතරයක් සිසුන් මෙහිදී PEST විස්තර කර තිබුනද, EL මගහැර තිබීම හේතුවෙන් අදාල සම්පූර්ණ ලකුණු ලබාගත නොහැකි විය.

(c) ආයතනික සමාජ වගකීම් (CSR) ව්‍යාපෘතිය දියත් කිරීම මගින් හැපී සුපර් (Happy Super) ආයතනට ලැබියහැකි වාසි සඳහන් කරන ලෙස දක්වා තිබුණි. බොහොමයක් ඔවුන්ගේ සාමාන්‍ය දැනීම උපයෝගී කරගෙන පිළිතුරු සපයා, සම්පූර්ණ ලකුණු ලබා තිබුණි.

(d) මෙම කොටස පාරිසරික තිරසරභාවය හා සම්බන්ධ විය. බොහොමයක් ප්‍රශ්නය හරිහැටි තේරුම් නොගැනීම නිසා අනවශය කරුණු ලියා සම්පූර්ණ ලකුණු මගහැරගෙන තිබුණි.

(e) ව්‍යවසායකත්ව කුසලතා පිළිබඳ දැනුම මෙමගින් පරිකෂාවට ලක්කොට තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

- - -

**<u>අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ මට්ටම සහ කාර්යසාධනය වැඩිදියුණු කර ගැනීම සඳහා සැළකිල්ලට ගතයුතු පොදු කරුණු:</u>**

(1) ප්‍රශ්ණ පත්‍රය ලැබුණු පසු එහි දී ඇති උපදෙස් පරීක්ෂාකාරීව කියවීම. (ඒ සඳහා අමතර කියවීමේ කාලය ප්‍රයෝජනයට ගත හැක).

(2) AAT විෂය නිර්දේශය/පාඩම් මාලාව මුළුමනින්ම අධ්‍යනය කිරීම.

(3) අයදුම්කරුවන් අවධානයෙන් ප්‍රශ්නය කීප වතාවක් කියවා, ලිවිය යුත්තේ කුමක්ද යන්න අවබෝධ කරගත යුතුය. ප්‍රශ්නය සඳහා ඍජු කෙටි උත්තර අපේක්ෂා කර තිබෙන විට අනවශ්‍ය පැහැදිලි කිරීම් සහ විස්තර නොලිවිය යුතුය.

(4) විභාගයේදී කාර්යක්ෂම ලෙස කාලය කළමණාකරණය කරගත යුතුය.

(5) පිළිතුරු සැපයීම එක් භාෂාවකින් පමණක් විය යුතුය. එය විභාගය සඳහා අයදුම් කල භාෂාවයි. සෑම නව ප්‍රශ්නයක් සඳහාම පිළිතුරු සැපයීම ආරම්භ කලයුත්තේ පිළිතුරු පොතේ අළුත් පිටුවකය. අත් අකුරු කියවිය හැකි මට්ටමක තිබීම හා උත්තර වලට ප්‍රශ්න අංක නිසිලෙස යොදා තිබීම ගැන සැළකිලිමත් විය යුතුය.

(6) උත්තර පත බාරදීමට පෙර සෑම පිටුවකම ප්‍රශ්න අංක සහ විභාග අංකය නිවැරදිව ලියා තිබේදැයි දෙවරක් පරීක්ෂා කරන්න.

(7) "කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව" ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහිදි දී ඇති අර්ථකථනවලට අනුකූල වෙමින් උත්තර ලියන්න.

(8) දැනුම වැඩිදියුණු කරගැනීමට, පසුගිය විභාගවල ප්‍රශ්න පත්‍ර අධ්‍යයනය කර උත්තර ලියා පුහුණු විය යුතුය.

(9) ඒඒටී ආයතනය මඟින් නිකුත් කරන ස්ව -අධ්‍යයන පාඩම්මාලා (Self-study Text) පොත්, යෝජිත උත්තර, ලිපි, සඟරා ආදිය කියවීම අනිවාර්යයෙන්ම කළ යුතුය.

(10) කිසිදු ප්‍රශ්නයක් මගහැරීම නොකලයුතුය. මෙම පුරුද්ද විභාගය අසමත් වීමට හේතුවක් විය හැක.

(11) හොඳ සූදානමකින් සහ විභාගය සමත්වීමේ පරම චේතනාව පෙරටුකොටෙගන විභාගයට මුහුණ දීය යුතුය.

- * * * -